# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

## මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

(1997 අංක 20 දරන පනත යටතේ ස්ථාපිත කරන ලදී)

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

**1. තනතුරු නාමය : අලෙවිකරණ හා ප්‍රචාරක නිලධාරී**

වැටුප් කේතය : JM 1-1- 2016

වැටුප් පරිමාණය : රු. 42600 - 755X10-1135X18-70580
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

**සුදුසුකම්** :

(අ) බාහිර අයදුම්කරුන් බඳවා ගැනීම (පහත 01 හෝ 02)

(01) අලෙවිකරණය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය හෝ ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(02) අලෙවිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය / වාණිජ්‍යය හෝ ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයකට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 1 හෝ 2)

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

(2) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) සේවා ගණයේ II වන ශ්‍රේණියේ මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2. තනතුරු නාමය : මාධ්‍ය සහකාර**

වැටුප් කේතය : MA 3-2016

වැටුප් පරිමාණය : රු. 32200 - 445X10-660X11-730X10-750X5-54960
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ උපාධියක් හෝ ජන සන්නිවේදන ක්ෂේත්‍රයකට අදාළ උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද (තොරතුරු තාක්ෂණ දැනුම අතිරේක සුදුසුකමක් වේ.)

**3. තනතුරු නාමය : අලෙවි ප්‍රවර්ධන සහකාර**

වැටුප් කේතය : MA 3- 2016

වැටුප් පරිමාණය : රු. 32200 - 445X10-660X11-730X10-750X5-54960
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි / ව්‍යාපාර / වාණිජ්‍යය / කළමනාකරණය/ ආර්ථික විද්‍යාව/ විද්‍යාව වැනි ක්ෂේත්‍රයකට අදාළ උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද.

**4. තනතුරු නාමය : මහජන සම්බන්ධතා නිලධාරී**

වැටුප් කේතය : MA 3- 2016

වැටුප් පරිමාණය : රු. 32200 - 445X10-660X11-730X10-750X5-54960
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද.

**5. තනතුරු නාමය : තොරතුරු තාක්ෂණ සහකාර**

වැටුප් කේතය : MA 3- 2016

වැටුප් පරිමාණය : රු. 32200 - 445X10-660X11-730X10-750X5-54960
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක සේවා පළපුරුද්ද.

**6. තනතුරු නාමය : ගිණුම් සහකාර**

වැටුප් කේතය : MA 2.2- 2016

වැටුප් පරිමාණය : රු.30310 - 300X10-350X7-600X4-710X20-52360
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම

ගණකාධිකරණය/ කළමනාකරණ ගණකාධිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍යය හෝ ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයකට ගැළපෙන්නා වූ තෘතීය හා අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩුව මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සමග** අධ්‍යන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර බඳවා ගැනීම් - ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**7. තනතුරු නාමය : කළමනාකරණ සහකාර තනතුර සහ අලෙවි සම්බන්ධීකාරක තනතුර - තනතුරු 02**

වැටුප් කේතය : MA 1.2- 2016

වැටුප් පරිමාණය : රු.27910-300X10-350X7-600X12-710X12-49080
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(1) (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ, ගණිතය ඇතුලුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පී සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ", "ඇ", සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා ඉල්ලුම් කළ හැක.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I සිංහල / දෙමළ

II ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

**සමග**

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**8. තනතුරු නාමය : රියදුරු**

වැටුප් කේතය : PL - 3- 2016

වැටුප් පරිමාණය : රු.26290 - 270X10-300X10-330X10-350X12-39490
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. **අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

සේවා ගණයට අදාළ පොදු බඳවා ගැනීමේ සුදුසුකම් පහත දැක්වේ.

**(01) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) ක් සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

(ආ) ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධව අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම. (බර වාහන පිළිබඳ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම විශේෂ සුදුසුකමකි.)

**(2) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධව අවම වශයෙන් වසර 03 ක පුරුද්දක් ලබා තිබීම.

**සහ**

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL2) ප්‍රාථමික ශිල්පීය නොවන (PL1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**9. තනතුරු නාමය : විදුලි කාර්මික**

වැටුප් කේතය : PL - 3- 2016

වැටුප් පරිමාණය : රු.26290 - 270X10-300X10-330X10-350X12-39490

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : **අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

**(01) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(අ) **විදුලි කාර්මික.**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ/ ගණිතය සහ විද්‍යාව යන විෂයන් ඇතුලුව විෂයන් 06 ක් සමත් වීම.

(ආ) ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා

**විදුලි කාර්මික**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හි හතර මට්ටමට (IV වන මට්ටම) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා වසර 03 ක සේවා පළපුරුද්ද

**(2) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**විදුලි කාර්මික**

අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික, අර්ධ ශිල්පීය (PL2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL1) සේවා ගණයක සේවකයින්

**හෝ**

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**10. තනතුරු නාමය : කාර්යාල කාර්ය සහායක**

වැටුප් කේතය : PL -1- 2016

වැටුප් පරිමාණය : රු.24750-250X10-270X10-300X7-330X15-37000

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් පරිවර්තනය වේ)

වයස : **අවු. 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

**පොදු කොන්දේසි**

**11. තනතුර** : ස්ථිර පත්වීම් ලබාදෙන්නේ නම්, විශ්‍රාම වැටුප් රහිත වන අතර, තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**12. වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර) අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**13. වෙනත්** : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**14. තෝරා ගැනීමේ ක්‍රමය** : ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරග විභාගයක හා/ හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් බඳවා ගැනීම් සිදු කෙරේ. සුදුසුකම් ලැබීම සඳහා අවම ලකුණු ප්‍රමාණය 40% ක් විය යුතු අතර, ලකුණු අනුව කුසලතා අනුපිළිවෙලින් අපේක්ෂකයින් බඳවා ගැනේ.

**15. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** : 2018.09.03

සියලු අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් දක්වන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග අයදුම්කරුවන් විසින් සකස් කරගන්නා ලද අයදුම්පත් **2018.09.03 දින හෝ ඊට** පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, **අයදුම් කරනු ලබන තනතුර** ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. නැතහොත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මානව සම්පත් හා පරිපාලන අංශයේ තබා ඇති පෙට්ටියට ගෙනවිත් බහාලිය යුතු වේ. **(අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු** අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.)

**සභාපති/ ප්‍රධාන විධායක**

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

**අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,**

**යූනියන් පෙදෙස, කොළඹ 02.**